# මැතිවරණ ප්‍රතිඵලය සති තුනකට කලින් කියපු හැටි !

## ජනාධිපතිවරයාගේ අවධානම් දැරීම අධ්‍යාපනිකව හැදෑරිය හැකියි,

## ආකර්ෂණීයම ප්‍රචාරණ ව්‍යාපාරය හර්ෂ ද සිල්වාගෙන්

## සන්ධානයට ප්‍රබල තේමාවක් තිබුණේ නැහැ

## ලංකාවේ 61% ක් කිසිම සමීක්ෂණයකට දායක වෙලා නැහැ.

## මානව චර්යා අධ්‍යයනයේ අලුත්ම අත්දැකීම

සාකච්ඡා කළේ
ප්‍රදීප් නයන ජයසිංහ

**දිනේෂ් විහඟුන් ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකාවෙන් බිහි වූ විශිෂ්ඨතම තරුණ නායකත්ව පුහුණුකරුවකු ලෙස හඳුනාගත හැකිය. සමාජීය හා දේශපාලනික වශයෙන් ද ඔහු ඉදිරිපත් කර ඇති මතවාද, ආයතනික හා කණ්ඩායම් සංවර්ධනය අරඹයා විශාල වශයෙන් බලපා ඇති බව අවිවාදිතය. ජාත්‍යන්තර ව්‍යාපාර, හැසිරීම් පිළිබඳ මහා බ්‍රිතාන්‍යයෙන් පශ්චාද් උපාධිය හිමිකරගෙන ඇති ඔහු පසුගිය මැතිවරණයේ ඡන්ද චර්යාව හා අවසන් ප්‍රතිඵල සඳහා, ගොඩනැගුණු පරිසරය පිළිබඳ 'දිනමිණ' හා කරන ලද විද්‍යාත්මක සම්මුඛ සාකච්ඡාවක් පහත පළවේ. ඉතා වේගයෙන් දියුණුවන නායකත්ව පුහුණු ආයතනයක් වන හයි බ්‍රෑන්ඩ් ටීම් (High Brand Team) හි ප්‍රධාන විධායක නිලධාරියා ද, කළමණාකර අධ්‍යක්ෂකවරයා ද වන්නේ දිනේෂ් විහඟුන් ප්‍රනාන්දු මහතායි. පසුගිය වසර දෙක තුළ පමණක් ඔහුගෙන් පුහුණුව ලද රාජ්‍ය සේවක ප්‍රජාව ද දහඅට දහසකට වැඩිය.**



**• පසුගිය කාලෙත් විවිධ මාධ්‍ය හා ෆේස්බුක් හරහා විශාල ප්‍රචාරණයක් ගෙන ගියා මැතිවරණ ප්‍රතිඵල වෙනස් කිරීම පිළිබඳ නමුත් ඔබ ඒ පිළිබඳ යම් සාකච්ජා වට ගණනාවක දී එය වැරදි අදහසක් බව පෙන්වා දීල තිබුණා?**

ඔව්, කිසිසේත්ම මැතිවරණ සමස්ථ ප්‍රතිඵලය කෘතිමව වෙනස් කරල නැහැ. එය ව්‍යාජයක් සහ වටිනාකමක් නැති කතාවක්. මොකද නාම යෝජනා දෙන්නත් පෙර අපි තොරතුරු එක් රැස් කෙරුව. හැබැයි හරියටම දෙයක් කියන්න පුළුවන් වෙන්නේ ප්‍රචාරණ වැඩ සමස්ථයක් ලෙස හැමෝම පටන් ගත්තම පමණයි. මොකද එතකොටයි ඡන්ද දායක චර්යාව හරියට ම විනිවිද යන්නේ. ඒ අනුව මැතිවරණයට සති 4 කට පෙරත් 3 කට පෙරත් විය හැකි දේ පිළිබඳ අපිට හොඳ තක්සේරුවක් තිබුණා. ඒ අනුවයි මම හරියටම සති 3 කට පෙර කිව්වේ එක්සත් ජනතා නිදහස් සන්ධානය ලක්ෂ 47 කට වඩා ඡන්ද ගන්නේ නැහැ කියලා. එය හරියටම හරි ගියා. ලක්ෂ 47 කට වැඩිය ඔවුන් ගත්තේ ඉතාම සුළු මනාප ප්‍රමාණයක්. එක්සත් ජාතික පක්ෂය ලක්ෂ 50 ක ඡන්ද ප්‍රමාණයක් පැහැදිලිව ම ගන්නා බව පේන්න තිබුණා. මොකද ජනාධිපතිවරණය ඉවර වෙලා 4 වෙනි සතිය වන විට මහින්ද මහතාට ඡන්දය දුන් අයගෙන් 4% ක් කිව්වා යහපාලන රජයත් වරදක් නැහැ කියලා. එතන ඉඳලා අපි නිරික්ෂණය කෙරුවා.

**• ඔබ ඔබේ විග්‍රහය කාට ද ඉස්සෙල්ලම කිව්වේ?**

මගේ හිතවතුන්ට සහ ආයතනයේ අයට, ඊට පස්සේ තව හිටපු ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක රොහාන් වැලිවිට මහත්මයට. මොකද ඔහු මගෙන් මැතිවරණය ගැන අදහස ඇහුව. මම ඔහුට කිව්වා. මට ආරංචි විදිහට ඔහු මෙය උදය ගම්මන්පිලටත් කියලා තියෙනවා. නමුත් ඔය හැමෝම තමන්ගේ මතවල ඉන්න අය. කව්රුත් පිළිගත්තේ ලක්ෂ 58 ක් තියනවා කියලා. ඒක එහෙම වෙන්න බැරි බව සරළ විද්‍යාත්මක තර්කයක්. ජනාධිපතිවරණයේ දී මෛත්‍රී ජනාධිපතිත්වරයා දිනනව කිව්වමත් ඔය වගේ නොපිළිගත් තත්ත්වයක් තමයි තිබුණේ.

**• පිළිගත්ත කෙනෙක් නැද්ද?**

ඉන්නව, බුද්ධික පතිරණ මන්ත්‍රීවරයත්, කරුණාරත්න පරණවිතාන මන්ත්‍රීවරයත්. ඒ එක්සත් ජාතික පක්ෂයෙන්.සන්ධානය පැත්තෙන් ඒක පිළිගත්තේ, තුෂාර පෙරේරා විතරයි. ඔහු මගෙන් ඇහුවා මගේ විග්‍රහය මොකක්ද කියලා. මං කිව්ව ලක්ෂ 47 යි ගන්නෙ කියලා. ඔහු ඇමරිකාවේ ඉඳල ආපු විද්‍යාඥයෙක්, ඉතා බුද්ධිමත් පුද්ගලයෙක්, සන්ධානයේ ප්‍රචාරණ වැඩපිළිවෙලටළඟින්ම දායක වුණු කෙනෙක්. ඔහු ගාමිණී ලොකුගේ මන්ත්‍රිවරයගේ බෑණා. හොඳ අනාගතයක් තියන ඉතා දක්ෂ තරුණ දේශපාලනඥයෙක්. නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාගේ සමීප මිත්‍රයෙක්. ඇත්තම කියනවා නම් මම හිතන්නේ තිරය පිටුපස්සේ හිටපු ප්‍රබලම මුලෝපායිකයා ඔහුයි.

**• ඔහු මොකද කිව්වේ**

ඔහු කිව්වා, ගෝඨාභය මහත්මයා ඇතුළු බොහෝ දෙනෙක් විශ්වාස කරන්නේ ලක්ෂ 58 කියලා. හැබැයි මං කිව්වා එ.ජා.ප ය ඉන්නේ ඉතාම ශක්තිමත් තැනක. මිනිස්සු විශාල වශයෙන් ඡන්දය දෙනවා කියලා. ඔහු එය පිළිගත්තා. එහෙනම් දැන් පරක්කු වැඩියි (Too late) කියල ඉංග්‍රිසියෙන් කිව්වා. තව බොහො දෙනෙක්ට මං කිව්වා එ.ජා.ප.ය දිනනවා කියලා. හරියටම සති 3 කට පෙර. ඡන්දයට පසුවත් තුෂාර මට කිව්වා දිනේෂ් විතරයි හරියටම කිව්වේ කියලා.

**• තව මොනාවද ඔබේ විග්‍රහයට අනුව විශ්ලේෂණය කළ දේවල්?**

රාජ්‍ය සේවයේ බොහෝ ඉහළ නිලධාරින් මාත් එක්ක කතා කෙරුව. මට ඒ කිසි දෙයක් කියන්න බැහැ. හැබැයි ස්ථිරවම පෙනෙන්නට තිබුණා. කෑගල්ලත්, කළුතරත් නාම යෝජනා අවස්ථාවේ දී සන්ධානයට විශාල වාසි තිබුණා කියලා. නාම යෝජනාවලට පෙර අපිට පෙනුනා සන්ධානයට කෑගල්ලෙන් 49% ක් හා කළුතර 52% ක්. නමුත් ඔවුන් දරුණු විදිහට මනාප පොරයට ගිහින්, දේශපාලනය පුද්ගලික ප්‍රශ්න බවට පත් කරගෙන මනාප විශාල ලෙස අඩු කරගත් බව. ඩලස් අලහපෙරුම ඇමතිවරයා මාත් එක්කම කියලා පිළිගත්තා කළුතර අසාර්ථක වෙන්න මනාප පොරයම බලපෑ බව. ඒක එහෙම වෙනවා මානසිකව (Psycologically). මොකද හෝමෝසේපියන්ස් සේපියන්ස් (Homo Sapians Sapians) මානවයා තීරණ ගන්න හැඟීම් මත ම ක්‍රියාකරන භාවිතය හරි අපුරු විද්‍යාවක්. ඒකයි ඇත්ත. ඒ වගේම බුද්ධික පතිරණ මන්ත්‍රීවරයා මනාප ලක්ෂයක් ගන්න බව මම ඔහුට කිව්වා. ඔහු 99000 ක් ගත්තා. ඔහු මගේම පාසැලේ මගේ මිත්‍රයෙක් නිසා මම ඒ ගැන පුද්ගලිකව සොයා බැලුවා. ඒ වගේම කරුණාරත්න පරණවිතාන මහත්මයාට රත්නපුරේ දිනන්න පුළුවන් කියලා මම පැහැදිලිව ම කිව්වා. නමුත් සැලැස්මක් ඕන වුණා දිනන්නත්. හොඳ සැලැසුමක්. ඒක හැදුවා. එක්සත් ජාතික පක්ෂයට ප්‍රකාශිත රාජ්‍ය සේවක ඡන්ද වලින් 15% ක් ඔහුට පළමු වටයේ දී ම රත්නපුරෙන් ඡන්දෙ දුන්න. ඒ වගේම කොළඹ එක්සත් ජාතික පක්ෂයේ ඡන්දය දෙන සෑම 5 දෙනෙකුගෙන් හතර දෙනෙක් ම තම මනාපය අග්‍රාමාත්‍යවරයාට දෙනව කියලා මම කිව්වා. ඒකත් හරියටම හරි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ලක්ෂ 5 ක් මනාප ගත්තා. ඒවගේම මම ගාල්ලේ පියසේන ගමගේ ඇමතිවරයාගේ පුතාට රන්දිම ගමගේට කිව්වා නොම්මර එකට එන්නේ චන්දිම වීරක්කොඩි මන්ත්‍රීවරයා බව. මැතිවරණයෙන් පසුව කණගාටුවෙන්න වෙන බව මම ඔහුට කිව්වා. ඔහුත් මගෙන් ඇහුවා. මම ඔහුට කිව්වා තව උත්සාහ කරන්න කියලා. එතකොට උපුල් ශාන්ත සන්නස්ගල ස්ථිරවම පරාජය වන බව පේන්න තිබුණා. ඔහු කියපුව මිනිස්සුන්ට තේරිලා නැහැ. එක්සත් ජාතික පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොටස් 4 ක් හරිම ආකර්ෂණීය වෙලා තිබුණා. A/L කරන්න O/L අසමත් වීම සාධකයක් නෙවෙයි කියන කථාව, නිවාස පන්ලක්ෂයක පොරොන්දුව, රැකියා දසලක්ෂයක පොරොන්දුව. වසර 5 ක නිවාඩු කාලයක් රාජ්‍ය සේවකයන්ට ලබා දෙනවා කියපු නව්‍ය පොරොන්දුව. ඒ නිසා විශාල තැපැල් ඡන්ද ප්‍රමාණයක් හා ඒ පවුල් වල ඡන්ද එජාපයට වැටුනා.

**• ඔබ දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට ගැතිව ද කටයුතු කළේ?**

නැහැ මම වෘත්තිකයෙක්, මට පක්ෂ දේශපාලනයක් නැහැ. ඒවගේම එහෙම දෙයක් තිබෙන්නත් බැහැ. මගේ පුහුණුවීම්වලට විවිධ මත දරණ, විවිධ පක්ෂවලට සහාය දෙන අය එනවා. ඒ හැමෝටම මම එකයි. අනික අපි කරන්නේ නූතන ආයතන සංස්කෘතියක් අරඹයා වන අධ්‍යාපනය. පටු පක්ෂ දේශපාලනය අපට කොහොමත් වැඩක් නැහැ. නමුත් උපායමාර්ගිකයෙක් (Strategist) හැටියට, මගේ විෂයයට අදාළව ඉතාම ප්‍රබල හා සියුම් විශ්ලේෂණයක් කරන්න හැකි වෙන්න ඕන. ලෝකෙ ඉන්න ප්‍රබල විශ්ලේෂකයන්ට එහෙම හැකියි. මමත් ඒ විෂයය ගැන විශාල උනන්දුවක් දක්වනවා. රාජ්‍යතාන්ත්‍රික නායකත්ව උපක්‍රම ගැනත් මම උනන්දුවක් දක්වනවා. එම නිසා මමත් මේ ගැන හදාරණවා. කව්රුහරි ඇහුවොත් මම කියනවා. ඒ නිසා හැම පක්ෂයකම මම දන්න අය ඉන්නවා. මොකද නැතිනම් මටත් තොරතුරු එන ක්‍රම අඩුවෙනවා. අනික මට නායකත්ව පුහුණුකරුවෙක් ලෙස අනාගතයක් තියෙනවා. නිපුණතා සංවර්ධන අරමුදලේ උපදේශිකාව කිව්වා ලංකාවේ මේ විෂයට සිටිය හැකි හොඳම පුහුණුකරුවා මං වෙන බව. ඇය යුරෝපයේ පවා පුහුණු හා සංවර්ධනය ගැන විශාල උනන්දුවක් දක්වපු කෙනෙක්. ඒ වගේම අමාත්‍යංශ ලේකම්වරු තිදෙනෙක් මට මුහුණට ම කියලා තියෙනවා ඔවුන්ගේ වෘත්තිය ජිවිතයේ දැකපු හොඳම පුහුණුව දුන්නේ අපි කියලා. ඒ වගේම හැම සමීක්ෂණයක් ම ඔප්පු කරලා තියෙනවා මේ නූතන අධ්‍යාපනය වඩාත්ම බලපාන අයුරින් ඉදිරිපත් කරලා තියෙන්නේ අපි කියලා. ආයතනික සේවක තෘප්තිය වසර දෙකක් ඇතුලේ 67% කින් වර්ධනය කරලා තියෙනවා කියලා පැහැදිලිව පෙනෙන්න තියෙනවා. කිසිම විදෙස් පුහුණුවකින්වත් එහෙම සංවර්ධනයක් වෙලා නැහැ. ඒ පසුගිය වසර 18 ට සාපේක්ෂව. මම ඉන්නේ නූතන අධ්‍යාපනයේ. මට පටු පක්ෂ දේශපාලනයක් නැහැ. මැතිවරණයේ දී එක්කෙනෙකුට දෙන්නෙකුට උදව් කෙරුවා. ඒ අය පාර්ලිමේන්තුවේ සිටිය යුතුයි කියන අදහසින්. ඒ හැරෙන්න මෛත්‍රී ජනාධිපතිවරයා ගැන ගෞරවයක් තියෙනවා. මොකද සුදුස්සන් සහ දක්ෂයන්ටත් ඔහු තැනක් දෙන බව පේනවා. ඔහුගේ අවධානම් දැරීමේ ශක්තිය අධ්‍යාපනිකව හැදෑරිය හැකියි. නායකත්ව අධ්‍යාපනයේ දී ඔහු හොඳ උදාහරණයක්. ඒ හැරෙන්න පක්ෂවලට කල්ලිවලට ගැති වෙන්න බැහැ. පසුගිය රජය දෙවතාවක් මට තනතුරුවලට අඬගැහුවා. ඒවා මට නොගැලපෙන නිසා මම ඒවා බාරගත්තේ නැහැ. පසුගිය රජයට අපෙන් වැඩක් ගන්න විශාල වැඩපිළිවෙලක් තිබ්බෙත් නැහැ. හැබැයි ශිෂ්‍යයෙක් හැටියට නම් මම ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ඇමතිවරයාව නම් සමීපව ඇසුරුකරලා තියෙනවා.

**• තව මොනවද ඔබ දැක්ක හා විග්‍රහ කළ දේවල්?**

අධ්‍යාපනික කරුණක් කියන්නම්. තරුණ දේශපාලඥයන්ට ආදර්ශයක් වෙන්න. කොළඹ පටන්ගන්න කොට හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරයා හිටියේ නොම්මර 7 ට. නමුත් ඔහුගේ ප්‍රචාරණ උපක්‍රමය උනේ. මම කව්ද නෙමෙයි. ''ඇයි මං පෙනී ඉන්නේ කියලා'' මේක විශිෂ්ඨතම මුලධර්මයක්. ලෝකේ සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන භාෂාවෙන් කියන දේ කියන්න ඕන. ඔය ඇපල් සමාගම වගේ, ලෝකය දිනපු ඕනෑම සමාගමක් හා එහෙම නැතිනම් මෝදි අගමැතිවරයත් දිනන වෙලාවේ පෙනී හිටියේ ඔය වගේ මුලධර්මයක් උඩ. එය හරිම ආකර්ෂණීයයි. විශිෂ්ඨතම ප්‍රචාරණ ව්‍යාපාරය ගෙන ගියේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරයා මේ මුළු මැතිවරණයේම. ඊළඟට සාගල රත්නායක මන්ත්‍රීවරයා. එය ඔහු හිටපු තැනින් ඉහළටම ඔසවා තිබෙනවා. මම ඔබට කියන්නේ කෙටි කලක් තුළ විශාල වර්ධනයක් ඇති කිරිමට දායක වුණු උපක්‍රමයි. රවී කරුණානායක මන්ත්‍රීවරයත් පටන් ගත්තේ 'දන්න කියන රවී' කියන ශිර්ෂ පාඨයෙන්. ඒක හුඟක් ආකර්ශනීය වුනා. නමුත් මග දී ඒක 'මිනිසුන්ගේ මිනිසා' කියලා වෙනස් කෙරුවා. ඒක මිනිස්සු ආකර්ෂණය කරන්න බර වැඩි මුලෝපායක්. මම ඒක ඔහුගේ මැතිවරණව්‍යාපාරයේ හිටපු රාහුල දන්දෙණිය මහත්මයට කිව්වා. මේකෙන් වාසියක් නැහැ කියලා.

**• ප්‍රතිඵලය මීට වඩා කිසිසේත්ම වෙනස්වෙන්න ඉඩක් තිබුණේ නැද්ද?**

නැහැ මැතිවරණය පටන් ගන්නකොටම කළුතර, ගම්පහ, කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රිකයන්තුළඑක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය තහවුරු වෙලා තිබුණා. නමුත් ඒ ඒ තැන්වල විශාල වැරදි ප්‍රචාරණ ක්‍රම හා විශේෂයෙන් මනාප පොරය දැඩි ලෙස එක්සත් ජාතික පක්ෂයේ අවාසියට හේතු වුනා. ඒ නිසා නාම යෝජනා දිලා සති 2 න් එහි අවාසිය ඒ තැන්වල එජාපයට එන්නේ. කණ්ඩායමක් විදිහට සියළු දෙනා නායකත්වයට සහාය දුන්නා නම් ඒ දිස්ත්‍රික්ක 4 ම එජාපය පැහැලිවම දිනනවා. හැබැයි අගමැතිවරයාගේ ප්‍රකාශන නිසා බොහෝ ජයග්‍රහණ එජාපයට ලැබුණා.

**• මහින්ද මහත්යාගේ ආකර්ෂණය පිළිඹිබු වෙන්න තරම් ඡන්ද තිබිය යුතු බවයි ප්‍රකාශ වෙන්නේ,**

නැහැ. 2010 මහ මැතිවරණයේ දී රනිල් වික්‍රමසිංහ මහතාගේ ජනප්‍රියතාවය තිබුණේ සෑම තිදෙනකුටම එක්කෙනෙක් ඔහුට කැමැතියි. මහින්ද මහත්තයට සෑම තුන් දෙනෙක්ගේම දෙන්නෙක් කැමති විදියට. මෙවර එහෙම නෙවෙයි. අග්‍රාමාත්‍යවරයා හැම විටම මිනිසුන්ට ලැබෙන ප්‍රතිලාභය හා නගා සිටුවන්නේ කොහොමද කියලා කතා කළා. එහි තේමාවක් තිබුණා. නිදහස් සන්ධානය ව්‍යාපාරයේ තේමාවක් තිබුණේ නැහැ. අතට අහුවෙන ගලකින් ගැහුවා. එය ජනවාරි ජනාධිපතිවරණයේදීත් එහෙමයි. මේ මැතිවරණයේ සිටි විද්‍යාත්මකම මිනිසා අග්‍රාමාත්‍යවරයා බවයි මගේ හැඟීම. ඔහුගේ කතා ටික බැලුවම පැහැදිලියි. මොකද ඔහු සංවර්ධනය මුල් කරගත් දැවැන්ත තේමාවක් එක වගේ අරගෙන ගියා. එය මෛත්‍රී ජනාධිපතිවරයා දූෂණය පිටුදකිමු කියලා අරගෙන ගිය තේමාව වගේ. ඒකමිතියක් තිබුණා, මිනිස්සුන්ට තේරෙන්න ඇයි අපි ඡන්දය දිය යුත්තේ කියලා. පණිවිඩයයි ප්‍රබල. ජනතා විමුක්ති පෙරමුණ ගන්නේ ආසන 5 යි කියලා මං කිව්වා. හැමෝම කිව්වා 12 ක් ගන්නවා කියලා. ජේ.වී.පී. එක කිව්වා 16 ක් කියලා. අමාත්‍යංශ ලේකම්වරු ගණනාවක් එක්ක මං ඔය බව කිව්වා.ලංකාවේ තීරණාත්මක මැතිවරණ වල දී විශාල පක්ෂ දෙක පමණයි, ලංකාවේ මිනිස්සු විශ්වාස කරන්නේ. ෆොන්සේකා මහත්මයාට එක ආසනයක්වත් නැතුව පරදිනවා කියලත් කිව්වා. වැඩිම මනාප ගන්න අයත් කිව්වා.

**• ඔබ කියපු විශ්ලේෂන හා අනාවැකි වල වැරදුනු තැන් තියනවාද?**

ඔව්, කොළඹ මගේ අදහස තිබුණා එක්සත් ජාතික පක්ෂය 51% ක් හා එක්සත් ජනතා නිදහස් සන්ධානය 41% ක් ලෙසයි නාමයෝජනා දෙනකොට. නමුත් එය එක්සත් ජාතික පක්ෂය 53% ක් හා සන්ධානය 39% ක් ලෙස වෙනස් උනා. නමුත් ඒකට උත්තරේ ප්‍රතික්ෂේපිත ඡන්ද වලින් හොයාගන්න පුළුවන්. කාටවත් බැහැ නිශ්චිතව කොතරම් ඡන්ද ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වෙයි ද කියලා කියන්න. ඒක කියන්නම බැහැ. දළ වශයෙන් හැරෙන්නට. මධ්‍යම ප්‍රමාණයක, ලක්ෂ 6 ක 8 ක වගේ ඡන්ද ලියාපදිංචිවෙලා තියෙන තැන්වල. කෑගල්ල, ගාල්ල හා මාතරත් විශාල ලෙස ඡන්ද ප්‍රතික්ෂේප වෙලා තියනවා. ඒක කොහොමත් මැතිවරණයේ තීරණාත්මක බලපෑමක්. ඒ වගේම අපිට තියන තොරතුරු වලට අනුව හිතලම ඡන්දේ කටුගාලා තියනවා ප්‍රතික්ෂේපිත ඡන්දවලින් 6% ක්. මේක විශාල ප්‍රශ්නයක්. මේ දේශපාලනය පිළිබඳව තියන අප්‍රසාදය වෙන්න පුළුවන්. නමුත් උතුරු නැගෙනහිර තොරතුරුත් තව තිබුණොත් අපට තව නිවැරදි විශ්ලේෂණයන් ඉදිරිපත් කරන්න පුළුවන්.

**• ඔබ කොහොම ද ඔබේ දේශපාලන විග්‍රහයන් හරියටම කල්තියා කියන්නේ?**

එක්තරා විදිකට නිවැරදි දත්ත පෙළගස්වන්න පුළුවන් ක්‍රමයක් තියනකොට ස්ථිරසාර හා නිවැරදි විශ්ලේෂණයන් ඉදිරිපත් කරන්න පුළුවන්. අද ඇමරිකාව, කැනඩාව, මහා බ්‍රිතාන්‍යය වගේ රටවල ප්‍රබල විශ්ලේෂකයන් මේ ක්‍රමය ඉතා හොඳින් භාවිතා කරනවා. දොන් කව්රි, බිල් ඇචේසන්, ජැන් හාට්ලේට් වගේ අවාචික සන්නිවේදනයේ විශේෂඥයන් මිනිසුන්ගේ හැසිරිම දිහා බලලා පුදුම දේශපාලන අනාවැකි කියනවා. එංගලන්තේ බ්‍රවුන් අග්‍රමාත්‍යවරයා පරදිනකොටත් ඇමරිකාවේ ඔබාමා ජනාධිපතිවරයා දිනනකොටත් ඒ ආයතන ටක්කෙටම කිව්වා. අතුරු මැතිවරණත් කිව්වා. ඊයේ පෙරේදා ඔස්ට්‍රේලියාවේ ටෝනි ඇබට් අගමැතිවරයාට වෙනදේත් කිව්වා.ඔහු ඉල්ලා අස්වුණා. මෙතන රහසක් නැහැ. ඉතා ගැඹුරු ලෙස ඡන්ද දායකයන්ගේ සිතුම් පැතුම්වලට ලංවෙන්න ඕන. එතකොට මේ දත්ත හරියට හොයාගන්න පුළුවන්. ඒකට තියන යන්ත්‍රණය තමයි සමාජ සබඳතා. සමික්ෂණ ආයතන විශාල ලෙස ලංකාවේතිබුණත්, ලංකා ජනගහනයෙන් 61% ක මිනිස්සු කිසි දිනක කිසිම සමීක්ෂණ පරික්ෂණයක කොටස්කාරයෙක් වෙලා නැහැ. මේකයි ඇත්ත. ඔක්කොම සමීක්ෂණ පරීක්ෂණ එන්නේ ඉතිරි 40% කට අඩු පිරිසකගෙන් අහපු දේවල්. හැබැයි ඔය කිසිම සමීක්ෂණයකට පරික්ෂණයකට භාවිතා නොවන අයගෙන් පවා 4% ක් ඔය සුපිරි තරු තෝරන වැඩසටහන්වලට නම් කෙටි පණිවිඩයක් (Text) එකක් හරි යවල තියනවා. ඒ හැර කිසිම භාණ්ඩ හෝ සේවා සමික්ෂණයකට සහභාගි වෙලා නැහැ.

**ඔබේ උපක්‍රමය හා න්‍යාය පැහැදිලි කරන්න**

අපේ ක්‍රමවේදය විද්‍යාත්මකයි. නිර්ණායක හැම දෙයක්ම ඉදිරිපත් කරන්න යාම ඉතා දීර්ඝ විශ්ලේෂණයක් වේවි. නමුත් තාර්කිකවම නිශ්චිතව විශ්ලේෂණයකට එන්න ඕනම මැතිවරණයක ප්‍රචාරණය පටන් ගන්න ඕන. ඡන්ද දායකයාව කියවගන්න පුළුවන් හොඳම වෙලාව ඒකයි. ප්‍රචාරණ වැඩ පටන් අරගෙන තේමා පාඨ ගෙනල්ලා, මතවාද ඉදිරිපත් කරගෙන යද්දි, මනාප පොරය, වාද විවාද, ප්‍රචාරණ ස්වරූප දෙස බලල 99% ක් ම නිවැරදිව විශ්ලේෂණය කරන්න පුළුවන්. හැබැයි ඒ සියල්ල කියන්නේ ඡන්ද දායක චර්යා දිහා බලල කරන්න පුළුවන් සියුම් දත්ත එකතු කිරිමෙන්. සමීක්ෂණයක් ඇත්තටම සාර්ථක වෙන්නේ එතකොට. ඒ නිසා ප්‍රතිඵල වෙනස් උනා කියන එක ව්‍යාජයක්. තම තමන්ගේ මැතිවරණ ප්‍රචාරණය සමග මිනිස්සු තේරුම් ගත් විදිය තමයි හරියටම මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙන්නේ. ඒක විද්‍යාව. මැතිවරණ කොමසාරිස්වරයා අවසානයේ අත්සන කරලා තියෙන්නේ 100% ක්ම නිවැරදි ප්‍රතිඵලවලට. ඒක නිසා මේ කාරණාවේදී නම් ජනාධිපතිවරයාට දොස් කීම කිසිසේත්ම යුක්ති සහගත නැහැ. ඒවා බාල දේශපාලන උපක්‍රම. ලක්ෂ 49 ක් සන්ධානයට ගන්න තිබුණු සුළු අවස්ථාවත් සන්ධානය ඔවුන්ගේ ම රාමුවල ඉඳලා නැති කර ගත්තා.